<u>5 වන පාඩම (අවසාන)</u>

# අභිවෘද්ධි ආලේපය තුළින් මගේ සන්තෝෂය අනිත් අයටත් බෙදා දෙමු.

## අභිවෘද්ධි ආලේපය අපි වැඩිහිටියෙක් වේ.

- මගේ ආගමෙන් මගේ සන්තෝෂය ලබන්න කළයුතු ප්‍රධාන ක්‍රියාකාරකම් මොනවාද?
- අපේ ආගමේ හැකියාවන් දියුණු කරගන්න ක්‍රම කියා දෙනවාද?
- අපේ ආගමේ හනම්ටි අදහස් වලට තැනක් තිබේද? අපි නවීන තාක්ෂණය භාවිතා කළ යුතුද?
- අපි කතෝලික වුවත් අසන්තෝෂයෙන්ද ඉන්නේ? කොට උඩද?
- මගේ සන්තෝෂයට මගේ ආගම යොදවාගෙන මමම නිපදවන්න ඕන චිත්‍රපටයක් තිබෙනවාද? (මම තනිකඩයෙක්/විවාහක/පූජක වුවත්)
- මම ජීවත් වෙද්දී මගේ සන්තෝෂය ලබන්න මෙලොව හෝ එලොව මම අනුගමනය කළ යුතු ප්‍රායෝගික ක්‍රම

අපේ ආගමෙන් හෝ ඕනෑම ආගමකින් අපි බලාපොරොත්තු වෙන්නේ ජීවිතය සතුටින් ගෙනියන්න. තමුන්ගේ ජීවිතය සන්තෝෂයෙන් නැත්නම් අපි කාර් එකේ එන්ජින් එක හරියට වැඩ කරනවද කියලා ඉස්සෙල්ලම බලන්න ඕනා.

### ❖ මගේ එන්ජිම (මගේ ආගමේ ප්‍රධාන ක්‍රියා)

1. ඉතින් අපි අනිත් අය විනිශ්වය කරන්න යනවා නම් (කෙකර ගාන එක) අපේ එන්ජිම දුවද්දී සීතල කරන එක නැතුව ගිහිල්ලා එන්ජිම බොයිල් කරනවා. දුවන්න බෑ.

දුම් යනවා.



2. අනිත් අය විනිශ්වය කරන්න ගියාම අපි හිතන්න ගන්නවා අපි හරි අනිත් කෙනා වැරදි කියලා. එහෙම හිතන්න ගියොත් අපිට උසාවි ඕන වෙන්නේ නෑ. අපි කැලෑ නීතියට යනවා. වැඩේ හිට්ලර් වෙනවා. ඉතින් අපි අපිට හිතුණොත් අනිත් කෙනා වැරදි කියලා, එයාට ඒක තේරෙන්නේ නැත්නම් අපි විනිශ්වය නොකර එය දෙවි මව් හරහා දෙවියන්ට භාර දී එයාට සමාව දෙන්න පුරුදු වෙන්න ඕනා. එහෙම ඔබ කළොත් බලන්න ඔයාට සන්තෝෂය ලැබෙන්නේ නැද්ද කියලා. ඉතින් අපි සමාව දෙන්න දන්නේ නැත්නම් අපේ කාර් එකේ එන්ජින් ඔයිල් නෑ. එන්ජින් ඔයිල් නැති කාර් එකක් පණ ගන්වන්න ගියොත් මොකද වෙන්නේ? එන්ජිම පිච්චෙනවා. ලොකු අළුත්වැඩියාවක් කරන්න වෙනවා කාරයට. බලන්න මේ සමාව දීම ජේසු තුමා ආවට පස්සේ අපි එතුමාට වන්දනා කරන්න ඕන එකම ප්‍රායෝගික සක්‍රමේන්තුව තමයි මේක. මේක දන්නේ නැත්නම් අපේ කාර් එකේ එන්ජිම කොට උඩ. අපිත් කොට උඩ. කාරය දුවන්න බෑ.



3. කාර් එක දුවන්න ඕන නම් කාර් එකේ තියෙන අනිත් කොටස් හොඳට වැඩ කරන්න ඕනේ. නැත්නම් කාර් එක දුවන්න බැරි වෙනවා. බලන්න මාළු ප්‍රාතිහාර්ය. අර මාළු පහ තිබෙන කෙනා ඔබ නම් ඔබගෙන් ඉල්ලුවොත් මට මාළු පහ දෙන්න කියලා ඔබ දෙයිද? ඔබ අහන්නේ නැද්ද "මොකටද ඔය මාළු? ඇයි වෙන කාගෙන්වත් ගන්න බැරිද? මම විතරද ඉන්නේ?" මාළු පහ ඉල්ලන කෙනා කිව්වොත් වෙන කවුරුත් නෑ මම මේ පන්දහකට කන්න දෙන්නයි යන්නේ කියලා ඔබ ඒ ඉල්ලන එක්කෙනාට බැනලා එලවන්නේ නැද්ද? "මූට පිස්සු, මේ මාළු පහ කොහොමද මෙයා පන්දහකට කන්න දෙන්නේ? මගේ මාළු නැති කරන්න යන්නේ කියලා හිතන්නේ නැද්ද? හිතනවා නේද?

මේ මාළු පහෙන් අදහස් කරන්නේ තමුන්ගේ හැකියාවයි. හැම කෙනාටම තමුන්ගේ කියලා හැකියාවන් දී තිබෙනවා මාව මේ ලෝකයට එවන්න තීරණය කරපු උත්තමයාණන්. ඉතින් තමුන් හැකියාවන් හොඳ අරමුණු සඳහා යොමු කළොත් තමුන්ට හිතන්න පුළුවන් මගේ මේ පොඩි දෙයින් ලොකු වැඩක් කරන්න පුළුවන් වෙයිද කියලා. හැබැයි තමුන් දකින්න ගන්නවා ලොකු ප්‍රාතිහාර්යක් වෙනවා කියලා. අද අපේ රටට මේ වගේ ප්‍රාතිහාර්යක් අවශ්‍යයි නේද? බලන්න කුඩා තෙරේසා මව්තුමිය. එයා මොනවද කළේ? ඕනෑම පොඩි දෙයක් හොඳ පරමාර්ථයක් ඇතුව කළා. එතුමිය ලොකු වැඩ කළේ නෑ. බලන්න අර මාළු පහ තිබුණ කෙනා ගැන. සුවිශේෂකවරු හතර දෙනාම එකම කතාව ලියලා වගේ. ඒක එතරම් වැදගත් අපිට වටහා ගන්න අපි අපේ හැකියාවන් දියුණු කර ගන්න ඕනේ කියලා. ඉතින් තමුන්ගේ හැකියාවන් නොදියුණු කර ගන්න අයට අපේ ආගමේ නම් සන්තෝෂයක් අත්දකින්න හම්බවෙන්නේ නෑ. කාර් එකේ අනිත් ඔක්කොම හොඳ වුණත් කාර් එක ඇලේටයි දුවන්නේ. බලන්න ශු. පාවුළු තුමා කුඩාරම් හැදුවද ජීවත් වෙන්න? ඇයි ඒ?



ජේසු තුමා පන්දහසකට කෑම දීම

### 3. අප හනමිටිකාරයන්ද? නවීන තාක්‍ෂණය අපි භාවිතා කළ යුතුද?



අපේ ආගමේ බොහොම ලස්සනට කියලා තියෙනවා කොහොමද හැකියාවන් දියුණු කර ගන්නේ කියලා. බලන්න ඉස්සර අපේ සීයට බර කරත්තයක් තිබුණා. සීයා බර කරත්තෙන් ගියේ. ඔබත් අද බර කරත්තේ යනවද? නෑ නේද? අද අපි කාර් එකේ යනවා. සීයා බර කරත්තේ ගියා කියලා අද අපි බර කරත්තේ යන්නේ නෑ නේද? හිනා යයි නේද අද අපි බර කරත්තේ ගියොත්! ඒ වගේ තමයි ඉස්සරහට ඕගොල්ලෝ සීයලා වෙද්දී ඔයාලා දකියි කාර් වෙනුවට මිනිස්සු හෙලිකොප්ටර් පාවිච්චි කරනවා. විදුලිය ගෙදරම නිපදවා ගන්නවා ජෙනරේටරයක් දාලා මඤ්ඤොක්කා කුඩු වලින්. හිතන්න බෑ නේද? අපේ ආගමේ කියලා තියෙනවාද ජේසු තුමා ගියේ බූරුවා පිටේ අපිත් බූරුවා පිටේ යන්න ඕනේ කියලා. බලන්න මේ ගැන සුවිශේෂකවරු තුන්දෙනෙත් ලියලා තිබෙනවා. අපි එක්කෙනෙක් ලිව්ව එක ගැන කියවා බලමු.

උපවාස ප්‍රශ්නය (ලූක් 5: 36-39)

උන්වහන්සේ ඔවුන්ට මේ උපමාවද වදාළ සේක: "කිසිවෙකු අලුත් ඇඳුමකින් රෙදිකඩක් ඉරා පරණ ඇඳුමකට අල්ලා මහන්නේ නැත. එසේ කළොත් අලුත් ඇඳුම ඉරී යනවා පමණක් නොව අලුත් ඇඳුමෙන් ගත් කෑල්ල පරණ ඇඳුමට කැපෙන්නේද නැත. කිසිවෙකු නව මිදියුස පැරණි බඳුන් වලට වත් කරන්නේ නැත. වත් කළොත් නව මිදි යුසින් බඳුන් පැලී මිදියුස වැගිරී බඳුනුත් නාස්ති වෙයි. නව මිදියුස වත් කළ යුත්තේ නව බඳුන්වලමය. තවද, පරණ මිදියුස පානය කළ කිසි මිනිසෙක් නව මිදියුස රුචි නොකරයි. පරණ මිදියුසම රස යැයි ඔහු කියන්නේය".

ඉතින් බලන්න අපේ තාත්තලා අද අන්තර්ජාලය හා විද්‍යුත් තැපෑල (Internet and E - mail) පාවිච්චි කරනවාද? නැත්නම් ඕගොල්ලන්ගෙන් ඒගොල්ලෝ ඉගෙන ගන්නවද? ඒගොල්ලන්ගේ පරණ වයින් ඒගොල්ලෝ පරණ භාජන වලමද දාගෙන ඉන්නේ? හැබැයි ඕනෑම හොඳ දේක නරකත් තියෙනවා. ඕගොල්ලන් ඒවා තුළින් නරක අරමුණු කරා භාවිතා කළොත් අපි ඉගෙන ගත්තා අපේ මනස විකෘති වෙන බව. ඉතින් අපිට අසභ්‍ය දර්ශන, චිත්‍රපටි ආදිය තුළින් අන්තර්ජාලය මගින් බලන්න ලේසි. ඒවා කළොත් කොට උඩ. හොඳ අරමුණු සඳහා ඉගෙන ගැනීමට හොඳ දේවල් තිබෙන එකම තැන අන්තර්ජාලයයි. දැන් ඕගොල්ලන්ගේ පාසලේ පුස්තකාලය වහන්න වෙයිද? ඉතින් අපේ ආගමෙන් අපිට නවීන තාක්ෂණය හරහා තමුන්ගේ හැකියාවන් දියුණු කරගන්න කියලා තිබෙනවා නේද?










විද්‍යුත් තැපෑල
E-mail

අන්තර්ජාලය
Internet

එහෙම නොකළොත් අපිට අපේ කාර් එකේ රෝද හා අනිකුත් දේවල් හොඳ වුණාට කාර් එකේ කොටස් එහෙම කැඩිලා කාර් එක දුවන්න බෑ නේද? ඉතින් අපි අපේ ආගමේ හැටියට සංවේදී වෙන්න ඕන. අපේ හැකියාවන් නවීන ක්‍රම භාවිතා කර දියුණු කරගන්නවා කියන්නේ හොඳ අරමුණු සඳහා අපේ හැකියාවන් යොදවන්න. බර කරත්ත වගේ නෙමේ අලුතෙන් ගත්තු කාර් එකක් වගේ.

ඉතින් බලන්න අපේ ආගමේ පොඩි පොත් 4කින් අපේ ජීවිතය සාර්ථක කරගන්නේ කොහොමද කියලා. අපිට කියා දෙනවා සමහර විට අනිත් ආගම් වගේ නෙමෙයි. ඒ ආගමුත් හොඳයි. අපේ ආගමේ අපිට සරලම සන්තෝෂය කරා යන විදිය කියා දෙනවා. මේ කාර් එක අපි මුළු ජීවිතයේදීම ඔළුවේ තියා ගත්තොත්, අපි භාවිතා කළොත් අපි ගොඩ නේද? හොඳ සන්තෝෂයෙන් අපිට ඉන්න පුළුවන් වේවි නේද?

එතකොට අපි බලමු අපේ ආගමේ ප්‍රායෝගිකව කරලා සන්තෝෂය අත්දකින්න කරුණු කීයක් තිබෙනවාද කියලා. විශ්වාස ලක්‍ෂණයේ කරුණු 12ක්, පරමණ්ඩලයේ කරුණු 7ක් හා දස පණතේ කරුණු 10ක් ලෙසය. මේවා ගැන අපි දන්නවා අපිට සන්තෝෂය අත්දකින්න පුළුවන් වෙනවා අපේ ආගම තුළින්. ඒ විදියට අපේ ජීවිතයේ අරමුණු සකස් කර ගන්නවා නම් බලන්න ඒ අත්තිවාරම උඩ අපි තව කරුණු 3ක් කරන්න ඕනා. මොනවද ඒ? සමාව දෙනවා වගේ අපේ පව්වලට අපි සමාකරගන්න ඕනා (සමහර ආගම්වල මේ පව් කමාව කරගන්න ප්‍රායෝගිකව අමාරුවෙන්න පුලුවන්) ඒ එක්කම අනිත් අය ඒ අය නැති තැන විවේචනය කරන්නත් හොඳ නෑ. එතකොට ඒ අයට අපේ ආදරය නැතිව යනවා. අවසාන වන විට තමුන්ගේ තිබෙන හැකියාවන් හොඳ අරමුණු සහිත තිබෙන තාක්‍ෂණයත් එක්ක කරගෙන යන්න මහන්සි වෙන්න ඕන. බලන්න දෙවැන ජුවම් පාවුළු පාප්තුමා(ලගදී නැති වුණා) අවුරුදු 81 දිත් අන්තර්ජාලය භාවිතා කර e-mail ඇරියා. අද අපේ තාත්තලා, අම්මලා, පූජක අය මේවාට බයද? නැත්නම් ඒවා ඉගෙන ගැනීමට කම්මැලිද? නමුත් කාර් එකක් එහෙම එළවන්න කම්මැලි නෑ නේද? ඒකත් මෝඩ කමක්ද? එහෙම වුණොත් අපි කොට උඩ නේද?



II වන ජුවම් පාවුළු පාප්තුමා

මගේ ජිවිත කාලය තුළ මගේ ඔළුවේ තියාගත යුතු මාගේ කාර් එක ගැන සන්තෝෂය අත්දකින්න, මගේ ආගමෙන් පහත සඳහන් චිත්‍රපටිය අමතක නොකරමු.

1. චිත්‍රපට එක.

මගේ ආගමේ මුලධර්ම




2. චිත්‍රපට දෙක

මම ජීවත් වෙන්නේ ඇයි? සන්තෝෂයෙන් ඉන්න.





# මේවා දන්නේ නැත්නම් අපේ ආගමේ අපි කොට උඩ

1. ප්‍රසාද ස්නාපනය => අපි දෙවියන් කෙරෙහි පමණක් විශ්වාස කරනවා.
   සාස්තර හෝ හොඳ වෙලාවල්, හඳහන් බැලුවොත් අපි කොට උඩ.

2. දිව්‍ය සත්ප්‍රසාදය => පුජාව වෙලාවේදි පියතුමා දිව්‍ය සත්ප්‍රසාදය වැඩමවද්දී ඒ පුපයට දෙවියන් එන බව අපි තරයේ විශ්වාස කරනවා. අපි දිව්‍ය සත්ප්‍රසාදයට කරන වන්දනාව බාහිරව වුණාත් අනිත් කාටවත් දෙන්න හොඳ නෑ නේද? එහෙම කළොත් අපි කොට උඩ නේද?
   ඉතින් අපි දිව්‍ය සත්ප්‍රසාදයට අපේ ඇඟට ජීර්ණය කරගත්තේ නැත්නම් අපි කොට උඩ. හිතෙන් විතරක් වන්දනා කරනවා කියන එකද, තමුන්වම රවට්ටා ගැනීමක් නේද? අපි ඒවාට දක්‍ෂයි නේද.

3. අපි අනුන් විනිශ්වය කළොත්, අනිත් අයට සමාව දෙන්න දන්නේ නැත්නම් අපි කොට උඩ.

4. අපි අපේ හැකියාවන් නවීන තාක්‍ෂණය තුළ දියුණු කර නොගත්තොත් අපි කොට උඩ.

5. ඉහත කරුණු අපේ ආගමෙන් අපිට යහපත් මාර්ගය ඉතා සරලව කියා දෙනවා ඒ මාර්ගය තුළින් අපිට සන්තෝෂය නිකන්ම ලබාගන්න ක්‍රම කියා දෙනවා. අපිට ලොකු පොත් ඕනේ නෑ. පොඩි පොත් 4 කොළ 120 කින් ඉගෙන ගන්න පුළුවන්. ඒ වගේම යාච්ඤා දෙකකින් හා දස පණතෙන්, ඒවායෙන් ගම්‍ය වන දේවල් කිරීමෙන් සන්තෝෂය අත්දකින්න පුළුවන්.

6 ඉහත සඳහන් කරුණු අපි කළොත් අපිට ස්ප්‍රිතු සාන්තු වරප්‍රසාද ලැබෙනවා. දෙවියන් අප සමග සිටිනවා. සන්තෝෂය නිකම්ම ලැබෙනවා.

ස්ප්‍රිතු වරප්‍රසාද තුළින් අපිට අපේ ජීවිතයේ පහත සඳහන් කරුණු 7 අත්දකින්න පුළුවන්.

ප්‍රඥාව, දැනගැන්ම, දැනමිතිකම, දේව භය, තේරුම් ගැනීම, ධෛර්යය, දේව භක්තිය

අපි මේවා කටපාඩම් කර අර කියපු කොට උඩ යන කාරණා කර කර හිටියොත් මොනවද අත්දකින්නේ? අසන්තෝෂයයි! එතකොට අපි කරන්නේ අභිවෘද්දි ආලේපයට අගෞරවයක්. එහෙම කට්ටිය වැඩිද අපේ රටේ? අපේ කතෝලිකයන් අතර? ඒකට ඔබ කණගාටුද? නෑ! අනිත් කට්ටියගේ සන්තෝෂය ඒගොල්ලෝ බලා ගත්තදෙන්. මගේ සන්තෝෂය මම බලාගන්න ඕන. ඊට පස්සේ මගේ සන්තෝෂය අනිත් අයට බෙදා දෙන්න ඕනේ. අඬ අඬා ඉන්න මනුෂ්‍යයෙකුගෙන් මොකක්ද ඔබ ඇහුවොත් ඔබ කළයුතු මාර්ගය සන්තෝෂය ලැබීමට කියලා ඔයා කියාදෙයි කොහොමද අඬන්නේ කියලා. එහෙමද අද වෙන්නේ?

**වැදගත් කරුණු 4යි.**

බලන්න කොට උඩ යන කාරණා කීයද තියෙන්නේ?4යි. කොයිතරම් ලේසිද, ප්‍රායෝගිකද අපේ ආගමෙන් සන්තෝෂයෙන් කල් ගෙවන්න මේ ලෝකයේදී විතරක් නෙවෙයි එන ලෝකෙදී වුණාත්!

අපි ජීවත්වෙද්දී අපිට ටැපලෙනවා. නැත්නම් භය, සාංකාව එනවා. අපිව එච්ච එක්කෙනා එක්ක ටිකක් තරහා යනවා මොකද මෙහෙම වෙන්නේ කියලා. එතකොට අපි කොහොමද අපේ විශ්වාසය තියාගන්නේ? බලන්න මට බඩේ ගෙඩියක් තියෙනවා. මගේ දොස්තර මහතා කියනවා අර ශල්‍ය වෛද්‍යවරයා ළඟට ගිහින් ඒක ඉවත් කරගන්න කියලා. ඉතින් මම ශල්‍ය වෛද්‍යවරයා ළඟට යනවා. ඉස්සෙල්ලම මම කැමති වෙනවා මගේ බඩේ තියෙන ගෙඩිය එයා ඉවත් කරනවට. ඉතින් එයාට මම කියනවද "මේ ඔයාට බෑ මගේ ඇඟට අත තියන්න, මම ම මේ ගෙඩිය ශල්‍ය කර්මයක් කරලා අරන් දාන්නම්" කියලා. එහෙම කිව්වොත් මට පිස්සුද? ඉතින් මම මුලින්ම කැමති වෙනවා මගේ ඇගේ තියෙන ගෙඩිය අයින් කරන්න. ඉතින් ඔහු මාව සිහිය නැති කරනවා. මරණවද? නෑ! ඔහු මගේ බඩේ තිබුණ ගෙඩිය අයින් කරලා, නරක කොටස් ඔක්කොම අයින් කරලා ආපහු මාව ගොඩ දානවා. මම ඔහුගෙන් අහනවද කොහොමද ඔයා ශල්‍ය කර්මය කළේ? මොන උපකරණද ගත්තේ? කියලා. වෛද්‍යවරයා කියයි ඔයා වෛද්‍ය විද්‍යාලෙට ගිහින් ඉගෙනගෙන එන්න කියලා. ඉතින් ඒ වගේ තමයි අපේ දිව්‍ය වෛද්‍යවරයාණෝ. අපි කැමැත්ත දුන්නොත් අපේ ලෙඩ හොඳ කරනවා. වෛද්‍යවරයාට මම කිව්වොත් මට ඔයාව විශ්වාස නෑ කියලා, ඔහු මගේ ඇඟට අත තියයිද? නෑ නේද? මම ඉතින් කොට උඩ නේද එහෙම වුණොත්?




වෛද්‍යවරයාගේ උදව් අපට අවශ්‍යයි



ඉතින් මම පළමුවෙන්ම කලබල වෙන්න යන්න ඕනේ නෑ. මගේ අසන්තෝෂය සන්තෝෂ කරන සමීකරණය මාව මේ ලෝකයට එවපු උත්තමයා හොඳටම දන්නවා. එයාට ඕන මගේ කැමැත්ත විතරයි, එයා කෙරෙහි විශ්වාසය විතරයි. ඒ විශ්වාසය දියුණු කරන්න අර වෛද්‍යවරයාගෙන් බේත් ගන්න ඕනේ. එහෙම නැත්නම් මම කොට උඩ. ඉතින් ඒ බෙහෙත් අපි මේ පාඩම් මාලාවෙන් (හරියට කොළ 5කින්) ඉගෙන ගත්තා. අපේ ආගම මේකයි නේද? ලේසියි නේද?

- **මූලධර්ම අතර වෙනස පරණ ගිවිසුමෙන් අලුත් ගිවිසුමට**

එතකොට දැන් අපි දන්නවා අපේ ක්‍රිස්තියානි ආගම ජුදා ආගම නෙමෙයි කියලා. ඒ ආගමේ (පරණ ගිවිසුම) හරහා ජේසු තුමා දෙවියන් වහන්සේගේ කැමැත්තෙන් අපිට සන්තෝෂය ලඟා කර ගන්න අලුත් ධර්මයක් කියා දුන්නා. ඒ අලුත් ධර්මය බොහොම සරළයි. අපිට ජීවිතයේ සන්තෝෂය ලඟාකරගන්න හුඟාක්ම ලේසියි. ඉතින් ඔබ ආඩම්බරද ඔබේ ධර්මය ගැන? එහෙම ආඩම්බර වුණාට ඔබ සන්තෝෂයෙන් නැත්නම් ධර්මය හරි හැටි නොදන්නවා වෙන්න පුළුවන් ඔබ කවුරු වුණත් (ලොකු වුණාම දෙමව්පියෙක්, පූජකතුමෙක්, සහෝදරතුමෙක්, කන්‍යා සොහොයුරියක් වුවත්)

ඉතින් ඔබ දන්නවා ජීවිතය සන්තෝෂයෙන් ගෙනියන්න ඔබ කාර් එක පදවාගෙන යනවා ඔබගේ ආගම තුළින්.(ඕනෑම ආගමක් හොඳයි) ඔබ මොන ආගමේ වුණත් වැඩක් තියෙනවාද ඔබ සන්තෝෂයෙන් නැත්නම්. අපි දන්නවා දෙවියන් වහන්සේගේ තීරණයෙන් අපි මෙහාට ආවේ. උන්වහන්සේ කවදාවත් අපිව අසන්තෝෂයෙන් තියන්න නෙවේ මෙහාට එව්වේ. ඉතින් දෙවියන් වහන්සේ ජේසු තුමා එන්න ඉස්සෙල්ලා මිනිසුන්ට කිව්වේ "මම කියන දේ කරන්න" කියලා. මට කවුරු හරි ගැහුවොත් මටත් එයාට ගහන්න කියලා. ඉතින් ජේසු තුමා හරහා එතුමා මේ කරුණු දෙකම වෙනස් කරලා අපිට සන්තෝෂයෙන් ඉන්න. දැන් දෙවියන් වහන්සේ කියන්නේ "මම ඔබට මොනවද කරන්න ඕනේ සන්තෝෂයෙන් ඉන්න". ඒ වගේම ඒ එක්කම එතුමා දැන් කියනවා මට කවුරුහරි ගැහුවොත් ඔහුට ගහන්න යන්න එපා සමාව දෙන්න, හත්වරක් නෙමේ, හැත්තෑහත් වාරයක් නෙමේ, හත්වාර හැත්තෑ හත් වාරයක් කියලා. මොකක්ද මේ? හරි අමාරුයි නේද අපිට කරන්න?

අපේ අම්මයි තාත්තයි අපිට ඕන දේ දෙනවා. හැබැයි අපි හුඟක් වෙලාවට මේ වයසෙදී ඉල්ලන්න ඕනේ. අම්මගෙයි තාත්තගෙයි හිත් රිද්දලා ඒගොල්ලන් කියන විදියට ජීවත් වුණේ නැත්නම් අපිට අපේ අම්මයි තාත්තයි උදව් කරයිද? අන්න ඒ වගේ තමයි දෙවියන් වහන්සේ අපිට අලුත් ධර්මයක් ජේසු තුමා, මරිය තුමී, ගෝලයෝ හරහා දන්නලා තියෙන්නේ. ඉතින් ඔය ධර්මය ප්‍රායෝගිකව කරන්න හරිම ලේසියි. ඕනෑම කෙනෙක් තමුන්ගේ ආගම අදහන්නේ සන්තෝෂයක් ලබන්න. හිනාවෙන්න, අඬන්න නෙවෙයිනේද?

අපි ඉහත දෙවන කරුණ වන සමාව දීම, කොහොමද අපිට සමාව දෙන්න වෙන්නේ, අනිත් කෙනා වැරදිද කියලා හුඟාක් මේ පාඩම් මාලාවේදී කල්පනා කළා. අපේ ආගමේ ප්‍රධාන කරතව්‍ය තමයි මිනිසෙකුට දීලා තියෙන නිදහස් කැමැත්ත කොහොමද තමුන්ගේ සන්තෝෂය ලබන්න ප්‍රායෝගිකව කරන්න ඕනෙ කියලා වටහා දීලා ඒකට යොමු කිරීම.

පළමු කරුණ බලපුවහම අපි ඉල්ලන සියලුම දේ අපිට දෙවියන් වහන්සේ දෙයිද? හොඳනම් අපිට දෙනවා. නැත්නම් අපිට ලැබෙන්නේ නෑ. අපි හිතමු අපිට අසනීප වුණා කියලා. ඉතින් දොස්තර කෙනෙක් ලඟට යන්නේ නැතුව නිකන්ම යාච්ඤා කර කර හිටියොත් වැඩේ හරි යයිද? නෑ. අපි දොස්තර ලඟට යන්න ඕනේ. අපි මහන්සි වෙන්න ඕනේ. තව කරුණක් තමයි අපි හිතමු අපිට මුදල් ඕනෑ කියලා. අපි දෙවියන්ගෙන් ඉල්ලනවා. දෙවියන් වහන්සේ ඉස්සර "මන්නා" ආකාසෙන් වැට්ටුවා වගේ අපිට මුදල් ආකාසයෙන් වට්ටයිද? නෑ. උන්වහන්සේ තවත් මිනිසෙකු මාර්ගයෙන් තමයි අපිට ඒ මුදල් ලැබෙන්න සලස්වන්නේ. ඉතින් අපිට තේරෙනවා අපි ජීවත් වෙද්දී අපිට තව අයගේ (මිනිස්සුන්ගේ) උදවු ඕනෑමයි සන්තෝෂයෙන් ඉන්න.

**අප්සෙට් යාළුවෝ.**

ඉතින් පළමුවෙන්ම දෙවියන් වහන්සේ අපෙන් අහන්න ඉස්සෙල්ලා "මම මොනවද ඔබට ඔබගේ සන්තෝෂය සඳහා කරන්න ඕනේ" කියලා අපි ඒ ප්‍රශ්නයම අපේ ගෙදර පවුලේ සාමාජිකයන්ගෙන්, යාළුවන්ගෙන්, සමාජයෙන් අහලා මට කරන්න පුළුවන් දෙයක් කරන්න ඕනේ.

හැබැයි ඔබගේ යාළුවන්ගේ මොළය මොන්ගල් නම් එයා ඉල්ලන්න පුළුවන් ඔයාගේ ආගමෙන් දෙන මූලධර්ම වලට විරුද්ධ දේවල්. එතකොට අපි ඒවා නොකරන්න ඕනේ. මොකද ඒ වගේ අයගේ මොළය මොන්ගල් හින්දා එහෙම කරන්න ගියොත් අපේ සතුට නැති වෙන හින්දා. අපේ ආගමේ අපි ඉගෙන ගත්ත මූලික කරුණු 28 අපේ ඔළුවේ ගලේ කෙටුවා වගේ තියෙන්න ඕනේ. නැත්නම් අපි නොදැනුවත්වම කොට උඩ යනවා.

ඔබ ඔබේ යාළුවන්ගෙන් අහනවා "මම මොකද්ද කරන්න ඕනේ ඔයාගේ සන්තෝෂයට" කියලා. යාළුවා පහත ආකාරයේ ඒවා ඉල්ලන්න පුළුවන්. බලන්න ඒවා ඔබගේ ආගමේ මූලධර්ම වලට හරිද කියලා.

01) අර යාළුවා හරි වැරදියි, අපි එයාට අංචියක් අදිමුද?
02) අද ගෙදර කවුරුවත් නෑ, අපි නිල් චිත්‍රපටියක් ගෙනල්ලා බලමුද?
03) පොඩ්ඩක් බීලා බලන්න මේ කුඩු. හරි ජොලි, අපිත් ටිකක් බීලා බලමුද?
04) මේ ජංගම දුරකථකයෙන් පිංතූර ගන්න පුළුවන්, අපි අසභ්‍ය දර්ශන පටිගත කරමුද?

එතකොට අපි බලන්න ඕනේ අපේ ආගමේ මොන මූලධර්ම වලට අපි පටහැනිද කියලා. එතකොට ඒ වගේ ඒවා අපි කරන්න හොඳ නෑ. කෙරුවොත් අපිට සන්තෝෂය ලැබෙන්නේ නෑ.

ඉතින් අපි අපේ යාළුවන්ට, නෑදෑයන්ට ඒගොල්ලන්ව සන්තෝෂ කරන්න අපේ මූලධර්ම වලට එකඟව කරන්න පුළුවන් දේවල් කරන්න ඕනේ. ඔහොම කරන්නේ මේ ලංකාවේ රැවටෙන්න පුළුවන් හින්දා. මොකද අපි රැවටීමට හරි දක්ෂයිනේ! ඉතින් මේ වගේ කරද්දී මුදල්, දේපල යනාදිය අනිත් අය සතුටු කරන්න දීමේදී අපි හුඟාක් දැනුවත් විය යුතුයි. මොන්ගල් විදියට වැඩ නොකළ යුතුයි.

අපි අපේ ආගමේ මූලධර්ම වලට එකඟව හොඳ අරමුණු සඳහා අනිත් අයගේ සන්තෝෂය (ඒ අයගේ හොඳ අරමුණු) සඳහා කළොත් දෙවියන් වහන්සේගෙන් අපි ඉල්ලන සියලු දේම අපිට ලැබේවි අපේ හොඳ අරමුණු ඉටුකරගෙන ජීවිතය සන්තෝෂයෙන් ගෙවන්න.

## සරළව සන්තෝෂය ලැබිය හැකි ක්‍රමය අපේ ආගම තුළින්




මෙහෙම කළත් සන්තෝෂයෙන් නෙමෙයි නම් අපි තව ටිකක් ගැඹුරට අපේ ආගමේ මූලධර්ම හරහා හැමදම යම්කිසි අභ්‍යාසයක් කළොත් හොඳයි නේද?

## ජපමාලය තුළින් මගේ ජීවිතය සන්තෝෂය



ඔබගේ දිවිය අපේ ආගම තුළින් සන්තෝෂය කරා යාවි. කවදවත් ඒ ගැන ඔබ බය විය යුතු නෑ.

**නිමි.**